

## ආ මග සටහන්

**දයාරත්න වීරසේකර**
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික, නියෝජ්‍ය විභාග කොමසාරිස්





# කුරුළු පාරාදීසයට අධ්‍යාපන චාරිකාවක්......

ශ්‍රී ලංකාවට දකුණෙන්, ඉන්දියන් සාගරයේ පිහිටි සීෂෙල්ස් දූපත් වල අතිශයින් චමත්කාර දිවයින වන, කුරුළු දිවයිනෙහි අධ්‍යාපන චාරිකාවකදී ලබාගත් අපූරු අත්දැකීමක් මෙසේ සටහන් කර තබමි.

ඉන්දියන් සාගරයේ නිරක්ෂයේ සිට අක්ෂාංශ අංශක 3 ක් ( 3 S) දකුණට සහ දේශාංශ අංශක 55 නැගෙනහිරට (55 E) පිහිටා ඇති සීෂෙල්ස් දූපත් සමූහය විවිධ ජෛව විවිධත්ව නිසා ලොව ප්‍රකට වී තිබේ. මෙයින් කුරුළු දිවයින සුවිශේෂිය. ප්‍රධාන දූපත වන "මාහේ" දූපතේ සිට කිලෝමීටර් 200 ක් පමණ ඈතින් පිහිටි කුරුළු දිවයිනට යාමට කුඩා ගුවන් යානයකට විනාඩි තිහක් පමණ ගතවේ.

හුණුගල් පසින් නිර්මාණයවූ කුරුළු දිවයින උතුරු කරයේ සයිබීරියාව මොන්ගෝලියාව වැනි රටවල අධික ශීතල දේශ ගුණය නිසා පැටවුන් හදා වඩා ගැනීම දුෂ්කර බැවින් එම ප්‍රදේශවල ජීවත්වන කුරුල්ලෝ, අභිජනන කාලයේදී නිරක්ෂය කිට්ටුව ඇති රටවල් වලට පර්යටනය (migration) වෙති. මෙසේ එනු ලබන එක් කුරුළු විශේෂයකි "සූටි ටර්න්" (sooty tern) යන නමින් හඳුන්වන මුහුදු ලිහිණියෝ. මොවුන් සෑම වසරකම මාර්තු සිට අප්‍රේලියෙල් දක්වා, සමූහ වශයෙන්, කුරුළු යුගල මිලියන හතක් පමණ සීෂෙල්ස්හි කුරුළු දිවයිනට පැමිණෙති.

හුණුගලින් නිර්මාණයවූ පස සහිත සමතලා දූපතක් වන මෙය එසේ නම්කර ඇත්තේ සෑම වසරකම දූපතට පැමිණෙන කුරුල්ලන් නිසාය. දූපත හුණුගල් මිශ්‍රිත පස් සහිත බැවින් තැනින් තැන ඇති කුඩා පඳුරු මිස, එහි විශාල ශාක නොමැත. මේ කාලයට වර්ග කිලෝ මීටර් එකක් පමණ වපසරියක් සහිත දූපතෙන් 90 % ක් පමණ සම්පූර්ණයෙන්ම කුරුල්ලන්ගෙන් වැසි යයි.

මෙම මුහුදු ලිහිණියන්ගේ තවත් සුවිශේෂී ලක්ෂණයක් වනුයේ පොලොව මතුපිට කුඩු සාදා ගැනීමයි. පොළොවේ පස්, පාද වලින් මෑත් කර බේසමක හැඩයට සාදාගන්නා කූඩුවෙහි කෝටු කැබලි කිහිපයක් සහ කොළ රොඩු ස්වල්පයක් අතුරා තිබේ.



බිම ලගින කුරුල්ලෝ

ඔවුන් පළමු වතාවට බිත්තර දෙකක් හෝ තුනක් දැමීම සහ එම බිත්තර ඉවත් කළහොත් නැවත බිත්තර කිහිපයක් දැමීම තවත් වැදගත් ලක්ෂණයකි. දෙවන වතාවේ බිත්තර ඉවත් කළහොත් තුන්වන වතාවටත් බිත්තරයක් හෝ දෙකක් දමන බව නිරීක්ෂණය කර තිබේ. මෙම සුවිශේෂී ලක්ෂණය පර්යටනය වන කුරුළු සමූහයේ සංඛ්‍යාව සමතුලිත තත්ත්වයක තබා ගැනීම පිණිස ස්වාභාවිකව සකස් වී ඇති වැදගත් අනුවර්තනයක් බව විද්‍යාඥ මතයයි. මෙම බිත්තර දැමීමේ සංසිද්ධිය උපයෝගී කර ගනිමින් වැඩිපුර ලබාගතහැකි කුරුළු බිත්තර එකතු කර රටට ආදායමක් ලබාගැනීමටද වැඩ පිළිවෙලක් සකස්කර ඇත. විද්‍යාත්මක දත්ත අනුසාරයෙන් කරනු ලබන බිත්තර එකතු කිරීම නිසා කුරුළු ප්‍රජාවේ සංයුතියට කිසිම හානියක් සිදු නොවන බව වාර්ෂිකව තබාගන්නා දත්ත වලින් පැහැදිලිවේ.

දිවයිනේ සිටින දහදොළොස් දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලය සහ වෙනත් කාර්යයන්හි නියුතු අය සියල්ලෝම විසි දෙනෙක් පමණ වෙති. කුරුල්ලන් ගැවසෙන කාලයේදී, එක දිනකදී දිවයිනට ඇතුල් වීමට අවසර ලැබෙන අමතර පුද්ගල සංඛ්‍යාව දොළොස් දෙනෙකුට සීමාකර තිබේ. කුරුළු බිත්තර එකතු කරන කාල සීමාවේදී එසේ පැමිණෙන අමුත්තන්ට බිත්තර එකතු කිරීමේ ඉතා විරළ ක්‍රියාකාරකමටද සම්බන්ධ විය හැකිය.

1991 වසරේදී එරට බහුතාක්ෂණික ආයතනයේ සේවය කළ මටද, ශිෂ්‍ය කණ්ඩායමක් සමග බිත්තර එකතු කිරීම සඳහා, කුරුළු දිවයිනට යාමට අවස්ථාවක් ලැබුණි. අප ආයතනයේ අනුමැතිය ඇතිව, අපට ලැබුණු එම අවස්ථාව ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් කර ගැනීමටද මම ක්‍රියා කළෙමි. කුරුළු දිවයින පාලක බලධාරීන්ට මේ බව දැන්වූ විට, ඔවුන් ඒ සඳහා බලවත් කැමැත්ත ප්‍රකාශ කර, පළපුරුදු උපදේශක වරයෙකුද ලබාදිය හැකි බව දැන්විය.

අධ්‍යයන චාරිකාව සඳහා සිසු සිසුවියන් දස දෙනෙකු තෝරා ගන්නා ලදී. ඔවුන් අතර ශිෂ්‍යයන් සය දෙනෙකු සහ ශිෂ්‍යාවන් හතර දෙනෙකු විය. ගමනට අවශ්‍යක ගුවන් ටිකට් පත්වල වියදමෙන් අඩක් ආයතනය මගින් දරණ ලදී.

අපගේ අධ්‍යයන චාරිකාවේදී කුරුළු දිවයිනේදී කළහැකි විද්‍යාත්මක ක්‍රියාකාරකම් රාශියක් එහි පාලන අධිකාරිය විසින් අපවෙත දන්වන ලදී.

මෙයින් කිහිපයක් මෙසේය
1. කුරුළු ගහණ ඝනත්වය (population density) ගණනය කිරීම
2. කුඩු විසිරී ඇති ආකාරය (distribution of nest) සටහන් කිරීම
3. කුඩු නියැදියේ ඇති බිත්තර සංඛ්‍යාව සෙවීම
4. පැයකදී කිරිල්ලිය සහ කුරුල්ලා ආහාර ගෙන එන වාර ගණන සෙවීම.
5. පැටවෙකු එක් දිනක ගන්නා අහාර ප්‍රමාණයේ බර, දළ වශයෙන් ගණනය කිරීම.
6. පැය භාගයක් තුළදී අපට නියමිත කුඩු වලින් බිත්තර එකතු කිරීම

මෙම ක්‍රියාකාරකම් සඳහා ඔවුන් විසින් භූමියේ එක් ප්‍රදේශයක් වෙන්කර එහි එක් කොටසක මීටර් 10 ඩ 10 අධ්‍යයන අනුච්ඡේද (quadrats) යක්ද බිම සටහන් කර තිබුණි. සරල මිනුම් ලබා ගැනීමට අවශ්‍ය විද්‍යා උපකරණද සපයන බව දැන්විය.

නියමිත දින උදයේම ගුවන් තොට වෙත ගිය අප සඳහා මගින් දොළොස් දෙනෙකුට පමණක් ගමන් කළහැකි කුඩා අහස් යානයක් වෙන්කර කර තිබුණි. ගුවන් යානය පැය භාගයකදී පමණ කුරුළු දූපතේ කුඩා ගුවන් තොටට ලගාවිය.

එය දූපතේ ධාවන පථයට සේන්දු වනවාත් සමග ඇසුණු කුරුල්ලන්ගේ නාදය ගුවන් යානයේ ශබ්දයට වඩා තීව්‍ර විය. ගුවන් නියමුවාද කුරුල්ලන් පියාසර කරන නිසා යානය ධාවන පථයට බැස්සවීමට මහත් පරිශ්‍රමයක් ගත්තේය. ගුවන් තොටට පැමිණ සිටි නිලධාරියෙක්, අප පිළිගෙන අධ්‍යයනය සඳහා සහාය වීමට වෙන්කර සිටි උපදේශකවරයාද හඳුන්වා දුන්නේය. පෙරවරු නවයට පමණ අපි අධ්‍යයන කටයුතු ආරම්භ කළෙමු.

මුලින්ම අපේ පිරිස කුඩා කණ්ඩායම් තුනකට වෙන් කර ගතිමු. එක් එක් කණ්ඩායම විසින් කළයුතු ක්‍රියාකාරකම්ද බෙදා ගතිමු. මේ සඳහා කාලය පැය දෙකක් පමණ වෙන්කර තිබුණි. අවශ්‍ය පරිදි සියලූම දත්ත දළ විස්තර, රූප සටහන්, වගු, ප්‍රස්තාර කෙටි සටහන් ආදිය මගින් ක්ෂේත්‍ර පොත්වල ඇතුළත් කර ගතිමු. මේ සඳහා උපදේශක වරයාගේ සහාය ඉතා ප්‍රයෝජනවත් විය. අපට වෙන්කර තිබුණු වර්ග මීටර් සියය තුළ කුරුළු කුඩු 48 ක් වාර්තා විය. මෙම කුඩු 48 හි හයක බිත්තර නොතිබුණි. 17 ක බිත්තර තුන බැගින්ද, පහක බිත්තර දෙක බැගින්ද ඇති බව සටහන් විය. පැටවුන් දෙදෙනා බැගින් සිටින කුඩු 20 ක්ද ඇති බව නිරීක්ෂණය කරන ලදී. මේ අවස්ථාව වන විට අපට වෙන්කර තිබුණු කොටසෙහි පැටවුන්ද සහිතව කුරුල්ලන් 136 දෙනෙක් සිටියහ. මේ නිසා එදින අප අධ්‍යයනය කළ කොටසෙහි කුරුළු ගහණ ඝනත්වය වර්ග මීටරයට කුරුල්ලන් 1.36 ක් විය.

අපට, කුරුළු බිත්තර එකතු කිරීමේ වැදගත්ම කාර්යය ළඟට කිරීමට සිදුවිය. ලැබුණු උපදෙස් අනුව, අවසාන අඩ පැය තුළදී කුඩුවලින් බිත්තර එකතු කරන ලදී.

මෙහිදී බිත්තර තුන බැගින් තිබුණු කුඩුවලින්